# මිනිසුන් පළමු වතාවට මත්ද්‍රව්‍යයට යොමුවීම කෙරෙහි බලපාන හේතු සාධකයන් විමසා බැලීම පිළිබඳ අධ්‍යයනයක් (නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානය ඇසුරින්)

**එම්. කේ. එන්. එස්. ලියනගේ**[1]

**සංක්ෂේපය**

වර්තමානයේ බහුල වශයෙන් සාකච්ඡාවට ලක්වන සමාජ පිළිලයක් ලෙසින් මත්ද්‍රව්‍ය හඳුනාගත හැකි ය. එනම් ඒවා එන්නත් කරගැනීම, පෙති වර්ග ලෙස භාවිතයට ගැනීම වැනි තත්ත්වයන් දක්වා අයහපත් අන්දමින් වර්ධනය වී තිබේ. ඒ නිසා සමාජයේ බොහෝ දෙනා මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වීම සුලබ කරුණක් වී තිබේ. මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ පුද්ගලයන් පුනරුත්තාපනය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුබද්ධ ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානවලට පුද්ගල කැමැත්ත හා උසාවි නියෝග පදනම් කරගනිමින් යොමු කෙරේ. මිනිසුන් පළමු වරට මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීම සඳහා බලපෑ හේතු සාධක විමසා බැලීම මෙහි අධ්‍යයන පරමාර්ථය වේ. ඒ සඳහා නියැදිය වශයෙන් නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානයේ නේවාසික ව ප්‍රතිකාර ලබන සේවාලාභීන් 30 දෙනෙකු සසම්භාවී ලෙස තෝරාගැනුණු අතර මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්තයන් ප්‍රධාන වශයෙන් සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හරහා ද එමෙන් ම ප්‍රශ්නාවලි මඟින් ද ,ද්විතීයික දත්තයන් අන්තර්ජාලය භාවිතයෙන් රැස්කිරීම සිදුවිය. එම දත්තයන් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විශ්ලේෂණය කිරීමෙන් අනතුරු ව මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ පුද්ගලයන් පළමු වරට මත්ද්‍රව්‍යයට යොමුවීම කෙරෙහි බලපෑ හේතු සාධක අනාවරණය කරගන්නා ලදි. ඒ අනුව සේවාලාභීන්ගෙන් 47%කගේ මතයට අනුව ඔවුන් මත්ද්‍රව්‍යයට මුල්වතාවේ යොමුවීමට බලපෑ හේතු සාධකය වන්නේ මිතුරු ඇසුරයි. 23%ක් වූ සේවාලාභීන් පිරිසකගේ අදහස වූයේ මත්ද්‍රව්‍ය සඳහා වූ කුතුහලය නිසා ඔවුන් ඊට පෙළඹුණු බවයි. එපමණක් නොව මත්ද්‍රව්‍ය සඳහා පවතින දැඩි කැමැත්ත, විනෝදය නිසා මුල් භාවිතයට යොමු වූ බව 17%ක සේවාලාභීන් පිරිසකගේ මතය වූ අතර, සේවාලාභීන් 13%ක ප්‍රමාණයක් පවසා සිටියේ වේදනාව නැතිකර ගැනීමට තමන් මත්ද්‍රව්‍ය මුල්වරට භාවිතා කළ බවයි.මේ අනුව මිනිසුන් වැඩි ප්‍රමාණයක් පළමුවර මත්ද්‍රව්‍යයට යොමු වන්නේ මිතුරු ඇසුර නිසා බැව් පැහැදිලි ය. ඒ අනුව පුද්ගලයින් පළමුවරට මත්ද්‍රව්‍යයට යොමුවීම නතර කිරීම තුළ ඊට වන ඇබ්බැහි වීම ද දුරු කළ හැක. කුඩා කල සිට ම දරුවන්ගේ මිත්‍ර සබඳතා යහපත් ලෙස පවත්වා ගැනිමට දෙමාපියන්ට ද වගකීමක් පවතී. අනෙක් අතට ඒ සඳහා පුද්ගලානුබද්ධ මෙන් ම ජාතික හා සමාජීය වශයෙන් සිදුවිය යුතු කාර්යභාරය ද සුවිශාල ය.

**මුඛ්‍ය පද :** මත්ද්‍රව්‍ය, සේවාලාභීන්, ඇබ්බැහි වීම

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nadeesha640@ gmail.com